(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 1(9).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2019 පෙබරවාරි 22 වැනි සිකුරාදා**

---

## 2019 මාර්තු 05 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය,— භාර ආඥා පනත යටතේ නියෝග,— (87 අධිකාරය) භාර ආඥා පනතේ 6අ වගන්තිය සහ 19අ වගන්තිය සමඟ කියවිය යුතු 115අ වගන්තිය යටතේ ප්‍රකාශිත භාරවලට අදාළ තොරතුරු සම්බන්ධයෙන් අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජනවාරි 28 දිනැති අංක 2108/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.02.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 දරන හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3) වගන්තිය සහ 14 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ වාහන වායු විමෝචන ප්‍රමිති සහ ආරක්ෂණ මිනුම්/ ප්‍රමිති සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජනවාරි 25 දිනැති අංක 2107/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.02.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2019 මාර්තු 15 වැනි සිකුරාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

113/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ඌව පළාත් සභාව තුළ සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින අක්‍රමිකතා සම්බන්ධව විගණකාධිපතිවරයාගේ අංක SIN/B/AG/KI/2017/02 හා 2017 අප්‍රේල් 20 දින ඌව පළාත් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති විමර්ශන වාර්තාව පිළිබඳ එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වාර්තාවේ ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදේශකවරුන් පත්කිරීම සම්බන්ධව අනාවරණය කර ඇති අංක 2 (අ) (i) සිට (x) දක්වා කරුණු;

(ii) එම අනාවරණයන්ට අදාළව අංක 2 (අ) (i) සිට (xiii) දක්වා නිරීක්ෂණය කර ඇති කරුණු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 මාර්තු 18 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2/'18

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බලශක්ති කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්ය සාධන බලකාය පිහිටුවනු ලැබූ නීතිමය පදනම කවරේද;

(ii) එම ආයතනය ආරම්භ කිරීමෙන් පසු ඉටු කරන ලද ප්‍රධාන කාර්යය කවරේද;

(iii) එම ආයතනය වෙනුවෙන් කරන ලද ආයෝජනයට සාපේක්ෂව, ප්‍රතිඵලයක් නොලැබී ඇති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

65/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට කිරි ගවයන් ආනයනය කිරීමේදී එක් ගවයෙක් සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් කිරි ගවයන් ආනයනය කිරීමේදී ගෙවන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වශයෙන් කොපමණද;

(iii) ආනයනික කිරි ගවයන්ගෙන් ප්‍රයෝජන ගත නොහැකි සහ මරණයට පත් වූ ගවයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ආනයනය කරන ලද කිරි ගවයන් වෙනුවෙන් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) පෞද්ගලික ව්‍යවසායකයන්ට අලෙවි කිරීමේදී එක් කිරි ගවයෙක් සඳහා අය කළ මුදල කොපමණද;

(vi) කිරි ගවයන් ලබාදීමට පෞද්ගලික ව්‍යවසායකයන් තෝරා ගැනීමේදී සලකා බලන ලද නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

116/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඌව පළාත් සභාව යටතේ පාලනය වන පාසල් කවරේද;

(ii) ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා එම ධූරයට පත්වීමෙන් අනතුරුව, එම පාසල්වලට පළාත් සභා ප්‍රතිපාදන මත ලබාදුන් ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) ගොඩනැගිලි ලබාදුන් පාසල්වල නම් හා ලිපිනයන් කවරේද;

(iv) එම ඉදිකිරීම් ලබාදුන් පුද්ගලයන්ගේ හා සමාගම්වල නම් හා ලිපිනයන් කවරේද;

(v) එම ඉදිකිරීම් වෙනුවෙන් පළාත් සභාව වැය කරනු ලැබූ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

214/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය විවෘත කළ දිනය කවරේද;

(ii) එම වෙළඳ සංකීර්ණයේ රථගාල විවෘත කළ දිනයේ සිට එමඟින් ලංකා ධීවර සංස්ථාව වාර්ෂිකව ලැබූ ආදායම කොපමණද;

(iii) එම රථගාලේ ආදායමෙන් කොටසක් පෞද්ගලික සමාගමක් වෙත හිමි වන්නේද;

(iv) එසේ නම්, එම මුදල වාර්ෂිකව කොපමණද;

(v) එම මුදල එකතු කිරීම ඉහත පෞද්ගලික සමාගමට ලබා දී ඇත්තේ ටෙන්ඩර් ක්‍රමවේදයක් අනුවද;

(vi) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද අනෙක් සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

624/'18

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ලංකා පොස්පේට් සමාගම දැනට ලබන ආදායම හා ලාභය කොපමණද;

(ii) 2015 වර්ෂයේ සිට එහි සභාපතිවරයා ලෙස කටයුතු කර ඇත්තේ කවුරුන්ද;

(iii) ඔහුට හිමි නිල රථ සංඛ්‍යාව, ඉන්ධන දීමනාව, වැටුප් හා දීමනා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වර්ෂ 2015 සිට මේ දක්වා ඔහුට ගෙවා ඇති සම්පූර්ණ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අනුමත ගෙවීම්වලට අමතරව වෙනත් ගෙවීම් කර තිබේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

(iii) එම ගෙවීම් සඳහා අනුමතිය ලබා දී ඇත්තේ කවුරුන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

320/'18

ගරු සිසිර ජයකොඩි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික පාසලක වසර 8ට වඩා වැඩි කාලයක් සේවයේ නියුතු විදුහල්පතිවරුන් ස්ථානමාරු කිරීමේ වැඩපිළිවෙළක් 2018 වර්ෂයේ සිට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, ඒ යටතේ ස්ථානමාරු කිරීම සඳහා යෝජිත ජාතික පාසල්වල නම් සහ ඒවායේ විදුහල්පතිවරුන්ගේ නම් කවරේද;

(iii) මෙම ස්ථානමාරු කිරීම් හේතුවෙන් ජාතික පාසල් පද්ධතිය මුළුමනින් බිඳවැටීම මෙන්ම, එම පාසල්වල අධ්‍යාපන මට්ටම කඩා වැටීමක් සිදු නොවන බවට සහතික වන්නේද;

(iv) එම පාසල්වලට නව විදුහල්පතිවරුන් පත් කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

378/'18

ගරු ජයන්ත සමරවීර මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2017.05.27 දින ඇතිවූ ගංවතුර හා නායයෑමෙන්, බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොලේගොඩ සිට ඉහළ වෙල්ගම දක්වා දිවෙන මාර්ගයේ 1 කණුව නමැති ප්‍රදේශය නායයෑමෙන් මේ වනවිට එම මාර්ගය භාවිතා කළ නොහැකි තත්ත්වයට පත්වී ඇති බවත්;

(ii) මෙම තත්ත්වය හේතුවෙන් එකී මාර්ගය පරිහරණය කළ අංක 819G මුදූන, 819H ගමගේ වත්ත, 824 තැන්නහේන සහ 825 ඉහළ වෙල්ගම යන ග්‍රාම සේවා කොට්ඨාසවල පිහිටි ඕමත්ත ජනපදය, ඕමත්ත කොළණිය, ගම්පලකන්ද, වවුලාකන්ද, මුදූන, බටේගල්ල, තැන්හේන, සමඟිපුර, ඉහළ වෙල්ගම, ගල්ලනමුල්ල, හේන්යාය සහ අටහවුල්හේන යන ප්‍රදේශවල 10,000 - 15,000 ක් අතර ජනතාවක් බරපතළ පීඩාවකට පත්වී ඇති බවත්;

(iii) මෙම මාර්ගය යථාවත් කිරීමට දැනට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) භාවිතා කළ නොහැකි සේ විනාශ වී ඇති උක්ත මාර්ගය කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දින වකවානු හා අවසන් කරන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

391/'18

ගරු තේනුක විදානගමගේ මහතා,— විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පූජනීය ස්ථාන හා පොදු ස්ථාන සඳහා සූර්ය බලශක්ති විදුලි ජනක යන්ත්‍ර කට්ටල සවි කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම එක් එක් ව්‍යාපෘතිය සඳහා වැය වන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වැඩසටහන කවර ආයතනයක් හරහා ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම සෑම ව්‍යාපෘතියක් සඳහාම නාම පුවරුවක් සවි කරන්නේද;

(ii) එසේ නම්, එක් නාම පුවරුවක් සඳහා වැය වන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 මාර්තු 19 වැනි අඟහරුවාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4/'18

ගරු හේෂා විතානගේ මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කුරගල පුරාවිද්‍යාත්මක ස්ථානය සංරක්ෂණය කිරීම සඳහා මේ වනවිට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

66/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත්, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පූගොල්ලාගම, බැලුම්ගල ප්‍රදේශයේ ඓතිහාසික වටිනාකමක් සහිත පුරාවිද්‍යා භූමියක් යන්ත්‍ර සූත්‍ර යොදා ගනිමින් විනාශ කර තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

(iii) අදාළ භූමිය තුළ පැරණි නෂ්ඨාවශේෂ දක්නට ලැබේද;

(iv) එම නෂ්ඨාවශේෂ කවර කාලවකවානුවකට අයත්දැයි අනුමාන කර තිබේද;

(v) එම භූමියේ අයිතිකරුවන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කාර්ය සඳහා අවසර ලබාදුන් නිලධාරියා කවුරුන්ද;

(ii) එම කාර්ය සිදුකිරීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරය ලබා දී තිබේද;

(iii) යන්ත්‍ර සූත්‍ර යොදා ගනිමින් මෙම පුරාවිද්‍යා ස්ථානය විනාශ කිරීමට දායකත්වය දැක්වූවන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

122/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් බදුල්ල දිස්ත්‍රික්කයේ පාසල් සඳහා ඉදිකළ දෙමහල් හා තෙමහල් ගොඩනැගිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගොඩනැගිලි ඉදිකළ පාසල්වල නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම ගොඩනැගිලි ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් ලබාගත් පුද්ගලයන්ගේ / ආයතනවල නම් හා ලිපිනයන් කවරේද;

(iv) එම ඉදිකිරීම් වෙනුවෙන් එක් එක් පුද්ගලයාට/ආයතනයට ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ඉදිකිරීම් කොන්ත්‍රාත් ලබාදීමේදී පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

323/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කැකිරාව නගරයේ පිහිටා ඇති බස් නැවතුම්පොළ 1977 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රමානුකූලව අලුත්වැඩියා කර නොමැති බැවින්, ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බවත්;

(ii) මේ හේතුවෙන් මගීන් මහත් හිරිහැරයට ලක් වන අතර බස් නැවතුම්පොළෙහි බස් හැසිරවීමද ඉතාමත් අසීරු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම බස් නැවතුම්පොළ ඉදිරියේදී ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

386/'18

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගයේ මුළු දුර ප්‍රමාණය කොපමණද;

(ii) මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එම මාර්ගය ඉදිකිරීමේදී ඉඩම් හා අනෙකුත් දේපළ අහිමිවූවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන් වෙනුවෙන් ලබාදීමට නියමිත වන්දි මුදල් මේ වනවිටත් ලබාදී තිබේද;

(v) එසේ නම්, ගෙවා ඇති මුළු වන්දි මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවල, දක්ෂිණ අධිවේගී මාර්ගයෙන් රජය උපයාගත් මුළු ආදායම වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත වර්ෂවලදී මාර්ගයේ අලුත්වැඩියා සඳහා වෙන් කළ මුළු මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

673/'19

ගරු එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ CRI නමැති ව්‍යාපෘතියක් ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක වන්නේද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ දැනට යෝජනා වී ඇති ව්‍යාපෘති කවරේද;

(iii) එම ව්‍යාපෘති අතර යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වී ඔය ව්‍යාපෘතියේ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) CRI ව්‍යාපෘතිය යටතේ දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ හෝ දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ රූකාෂල් නමැති ව්‍යාපෘතියේ ප්‍රගතිය කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ සැලැස්ම මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iii) මෙම ව්‍යාපෘතියෙන් දැරණියගල නගරය ජලයට යටවන්නේද;

(iv) මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(v) එම ඇස්තමේන්තුව සහ සැලැස්ම මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

411/'19

ගරු නිහාල් ගලප්පත්ති මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක කිරීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවන ලද නිෂ්පාදන බදු අංශයෙහි සේවය කිරීම සුරාබදු පරීක්ෂකවරුන් විසින් ප්‍රතික්ෂේප කරන ලද බවත්;

(ii) එබැවින්, එම පනතේ සුරාබදු පරීක්ෂක සේවයට අයත් රාජකාරි ඉටු කිරීම සඳහා බඳවාගන්නා ලද උප පරීක්ෂකවරුන්, සුරාබදු පරීක්ෂක සේවයට උසස් කිරීම පිණිස මුදල් රෙගුලාසි 71 යටතේ සුරාබදු පරීක්ෂක තනතුරු 10 ක් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කර ඇති බවත්;

(iii) අනුමත කළ එම තනතුරු සුරාබදු දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන බදු අංශයට අනුයුක්ත කර ඇති උප පරීක්ෂකවරුන් උසස් කිරීම මඟින් පිරවීමට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කර ඇති බවත්;

(iv) පරීක්ෂණයක් මඟින් උසස්වීම් ලබාදී එම තනතුරු 10 පිරවීම සඳහා අනුමත කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) නිෂ්පාදන බදු උප පරීක්ෂකවරුන් සුරා බදු පරීක්ෂක තනතුරට උසස් කර තිබේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

416/'19

ගරු ගාමිණී ලොකුගේ මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015.01.15 වැනි දිනට මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවයේ යෙදී සිටි ස්ථිර, අනියම් හා කොන්ත්‍රාත් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015.01.15 දින සිට 2018.05.15 දින දක්වා මධ්‍යම සංස්කෘතික අරමුදලට ස්ථිර, අනියම් හා කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගෙන ඇති සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම බඳවා ගැනීම් මධ්‍යම සංස්කෘතික අරමුදලේ පිරිස් පාලන සැලැස්මට අනුකූලව සිදු කර තිබේද;

(iv) ඉහත (ii)හි සඳහන් සේවකයන් වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලින් වැටුප් හා දීමනා ලෙස මාසිකව වැය කරනු ලබන මුදල කොපමණද;

(v) 2015.01.15 දින සිට 2018.05.15 දින දක්වා මධ්‍යම සංස්කෘතික අරමුදලින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ස්ථිර, අනියම් හා කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගෙන ඇති සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ඉහත (v)හි සඳහන් සේවකයන් වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලින් වැටුප් හා දීමනා ලෙස මාසිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 මාර්තු 21 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

21/'18

ගරු හේෂා විතානගේ මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, ගොඩකවෙල, වේරහැර ජල ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් කළද එය අතරමග නවතා දමා ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් එම ප්‍රදේශයේ ජනතාව දැඩි පීඩාවකට පත්වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) සැලසුම් කළ පරිදි එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම කඩිනම් කරන්නේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

123/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධි වැඩසටහන යටතේ අඩු ආදායම් පවුල් සඳහා නිවාස ආධාර ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, යහපාලන රජය බලයට පත්වීමෙන් පසුව, එම නිවාස ආධාර ලැබූ බදුල්ල දිස්ත්‍රික්කයේ පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉදිරියේදී මෙම ව්‍යාපෘතිය යටතේ වැඩි නිවාස ආධාර ප්‍රමාණයක් බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

244/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එම කොට්ඨාසය තුළ කැණීම් නොකරන ලද එහෙත්, හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන පිහිටා තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) ඉහත කොට්ඨාසයේ පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත රජමහා විහාර සංඛ්‍යාව කොපමණද; ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත පුරාවිද්‍යාත්මක ස්ථානවල සංරක්ෂණ කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

490/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරවුම්හල්වල ලිපිනයන් කවරේද;

(iii) එම පිරවුම්හල් අතරින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු පිරවුම්හල් හා IOC සමාගම සතු පිරවුම්හල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2010 වර්ෂයේ සිට මේ දක්වා මහනුවර දිස්ත්‍රික්කය තුළ ලබා දී ඇති ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(v) එම බලපත් ලබාගත් පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(vi) එසේ බලපත්‍ර ලබාදීමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව උපයාගත් මුදල කොපමණද;

(vii) එසේ ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර ලබාදීමේ දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සැලකිල්ලට ගනු ලැබූ නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

588/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 211ට අනුව, ට්‍රිපල් සුපර් පොස්පේට් (T.S.P.) නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශය දිරිගැන්වීමට අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ පොස්පේට් නිධියෙහි, ශක්‍යතා අධ්‍යයනය පිළිබඳ සකසා ඇති වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) 1990 සිට මේ දක්වා රාජ්‍ය අංශය විසින් පොස්පේට් නිෂ්පාදනය සඳහා ලබාදුන් දායකත්වය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) රාජ්‍ය අංශය මඟින් පොස්පේට් නිෂ්පාදනය සඳහා ලබා දුන් දායකත්වය මඟින් පොහොර ආනයනයට යන වියදම (වාර්ෂිකව) කවර ප්‍රමාණයකින් අඩුකර ගනු ලැබුවේද;

(v) මෙම අයවැය යෝජනාවෙන් මේ වනවිට අත් කරගෙන ඇති ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

678/'18

ගරු කනක හේරත් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කුඩා රබර් වතු කර්මාන්තයෙන් ජීවත්වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) රබර් කර්මාන්තය පහත වැටීම හේතුවෙන් අද වනවිට ඔවුන් ඉතාම අසරණ තත්ත්වයට පත් වී ඇති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයට පෙර, වර්ෂයකට එක් අයෙකුට කොපමණ රබර් ප්‍රමාණයක් සඳහා ආර්ථික සේවා ගාස්තු ( ESC) බදු අය කරන ලද්දේද;

(ii) එම බදු මුදල කොපමණද;

(iii) අද වනවිට මෙම ESC බද්ද එක් අයෙකුට කොපමණ රබර් ප්‍රමාණයක් සඳහා අය කරනු ලබන්නේද;

(iv) මෙම බදු ක්‍රමය මඟින්, කුඩා රබර් වතු කර්මාන්තයේ යෙදී සිටින ජනතාව හා කුඩා රබර් වතු ව්‍යාපාරිකයන් තවත් පීඩනයට පත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

689/'19

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2015 දක්වා වූ කාල පරිච්ඡේදයේදී, සීමාසහිත ලංකා රෝහලේ කොටස් හිමියෙකු ලෙස ගෝඨාභය රාජපක්ෂ මහතා කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම කාල පරිච්ඡේදය තුළදී සීමාසහිත ලංකා රෝහලේ සභාපති ලෙස ඒ මහතා ලබාගත් වැටුප් සහ දීමනා කවරේද;

(iii) වර්ෂ 2010 සිට 2015 දක්වා කාලය තුළ සීමාසහිත ලංකා රෝහල වාර්තා කළ වාර්ෂික ලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

476/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් විලියමුල්ල වතුයායේ ඉඩමක් බදු පදනම යටතේ ලබා ගෙන ඇති පුද්ගලයාගේ නම කවරේද;

(ii) එම ඉඩමේ වර්ග ප්‍රමාණය කොපමණද;

(iii) නව තක්සේරු වාර්තාවට අනුව වර්ෂ 2013 සිට 2015 දක්වා බදු අය නොකිරීම හේතුවෙන් මණ්ඩලයට අහිමි වූ මුදල කොපමණද;

(iv) මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 මාර්තු 22 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

23/'18

ගරු හේෂා විතානගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ, වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අම්බැවිල හන්දියේ සිට රංවල හරහා උඩවෙල මාර්ගය වසර ගණනාවක සිට අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් දැඩි ලෙස අබලන්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය අයත්වන ආයතනය කවරේද;

(ii) මෙම මාර්ගය ගමනාගමනයට සුදුසු වන ලෙස අළුත්වැඩියා කිරීමට සැලසුම්කර තිබේද;

(iii) එසේ නම්, අළුත්වැඩියා කිරීම ආරම්භ කරනු ලබන දිනය සහ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iv) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(v) මේ වනවිට එම මුදල් වෙන්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

133/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ පාසල් අතරින් තාක්ෂණික විද්‍යාගාර පහසුකම් ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) බදුල්ල දිස්ත්‍රික්කයේ සිසුන්ගේ තාක්ෂණික දැනුම වැඩි කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

335/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග බොහොමයක් අබලන් වීම හේතුවෙන් මහජනතාව දැඩි අපහසුතාවයට පත්වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, මෙම මාර්ග කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

456/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාදම්පේ, ඓතිහාසික තනිවැල්ල දේවාලය අසළ කිනිපිටිය වැව නමින් වැවක් තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම වැවේ ජලයෙන් වගා කරන කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එමඟින් ප්‍රතිලාභ ලබන ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iv) අද වනවිට එම වැවේ විවිධ ජලජ ශාක වැඩී වැව ඉතා අබලන් තත්ත්වයට පත්වී තිබෙන බව දන්නේද;

(v) එසේ නම්, එම වැව කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

536/'19

ගරු බිමල් රත්නායක මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මහජන සම්පත 'රජ දිනුම' නමින් ලොතරැයි දිනුම් ඇදීමක් සිදුකරන බවත්;

(ii) එම ලොතරැයියේ 3328 වැනි දිනුම් ඇදීමෙන් අලුත්ම හයිබ්‍රිඩ් මෝටර් රථයක් ලබා දෙන බවට ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ප්‍රචාරක දැන්වීමක් පළ කළ බවත්;

(iii) එම දිනුම් ඇදීමේදී උඩුදුම්බර, මඩුගල්ල, කලමුන පදිංචි කේ. ඩබ්ලිව්. ජී. බී. කපුකොටුව මහතා මෝටර් රථය ජයග්‍රහණය කළ බවත්;

(iv) එම මෝටර් රථය 2017.01.25 දින ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පරිශ්‍රයේදී කපුකොටුව මහතාට භාරදුන් බවත්;

(v) වාහනයේ ලියාපදිංචි සහතිකය පරීක්ෂා කිරීමේදී ඒ මහතාට ලබාදී ඇත්තේ අලුත් (Brand New) මෝටර් රථයක් නොව පාවිච්චි කර අලුත්වැඩියා කරන ලද (Reconditioned) මෝටර් රථයක් බවත්;

(vi) මේ ගැන ජාතික ලොතරැයි මණ්ඩලයට පැමිණිලි කළද, කිසිදු පිළිතුරක් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා මෙම වංචාව සිදුකළ අයට එරෙහිව නීත්‍යානුකූල පියවර ගන්නේද;

(ii) කපුකොටුව මහතාට නව මෝටර් රථයක් ලබාදීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

589/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 293ට අනුව, කොටස් වෙළඳපොළෙහි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා කවුළුවක් පිහිටුවනු ලැබුවේද;

(ii) කොළඹ කොටස් වෙළඳපොළෙහි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට වඩා වාසිදායක ලෙස මූල්‍ය පහසුකම් සැලසීමේ උදාර අරමුණ ඉටු කරලීමට අදාළ වන මෙම කවුළුව පිළිබඳ කර්මාන්තකරුවන් ප්‍රමාණවත් අයුරින් දැනුවත් වී නොමැති බව පිළිගන්නේද;

(iii) එසේ නම්, මෙම කවුළුව පිහිටි ස්ථානය හා කර්මාන්තකරුවන්ට ලබාදෙන මූල්‍ය සහනයන් පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරන්නේද;

(iv) ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඇරඹීමට අවශ්‍ය "බීජ ප්‍රාග්ධනය" සහනදායී කොන්දේසි සහ සහන පොළී අනුපාතිකයන් යටතේ, ව්‍යවසායකත්ව හැකියාවන් ඇපයට තබාගෙන මූල්‍ය සම්පත් ප්‍රදානය කරන ජාතික වැඩපිළිවෙළක් සැකසීමට මැදිහත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

477/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අංක 175, වොක්ෂෝල් පටුමග යන ලිපිනයේ පිහිටි ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් ගොඩනැගිල්ල බදු පදනම මත ලබා දී ඇති ආයතනය කවරේද;

(ii) එම ගොඩනැගිල්ල බදු දී තිබූ කාලය හා බදු මුදල කොපමණද;

(iii) මෙම ගොඩනැගිල්ලට බදු කුලී නොගෙවීම හේතුවෙන් බදුකරුවෙකු මෙම ගොඩනැගිල්ලෙන් නෙරපා හැර ඇති බව දන්නේද;

(iv) නෙරපා හැරි බදුකරුගෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු දේපළ ආපසු පවරා ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

759/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් වකුගඩු රෝගීන් සිටින පවුල්වල නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ආධාර මුදලක් ලබා දෙන බව දන්නේද;

(ii) එම ප්‍රතිලාභය ඉල්ලුම් කිරීමට අවශ්‍ය කරන සුදුසුකම් සහ ඉදිරිපත් කළ යුතු ලේඛන කවරේද;

(iii) ඒ යටතේ නිවසක් අලුත්වැඩියා කිරීම සඳහා ලබා දෙන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඉහත සඳහන් නිවාස ආධාර ඉල්ලුම් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉල්ලුම්කරුවන් අතරින් නිවාස ආධාර ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සුදුසුකම් සපුරා ඇති ඉල්ලුම්කරුවන් සියල්ලන්ටම එම මුදල ලබා දෙනු ලබන දිනය කවරේද;

(iv) අලුත්වැඩියා කර ගැනීමට තරම්වත් නිවසක් නොමැති පැල්පත්වල ජීවත් වන වකුගඩු රෝගීන්ද සිටින බැවින්, ඔවුන්ට නිවසක් ඉදිකරදීමේ වැඩපිළිවෙළක් ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 මාර්තු 23 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

25/'18

ගරු හේෂා විතානගේ මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කර්මාන්ත දියුණු කිරීම සඳහා රජය අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) මේ වනවිට ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) ග්‍රාමීය කර්මාන්ත පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති ප්‍රමාණවත් වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

840/'19

ගරු කනක හේරත් මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීතාවක ගඟ හරස් කර දැරණියගල ප්‍රදේශයේ ජලාශයක් ඉදි කිරීමට කටයුතු සූදානම් කර තිබේද;

(ii) එසේ නම්, මෙම ව්‍යාපෘතියේ අරමුණ කවරේද;

(iii) එමගින් මෙම ප්‍රදේශයේ නායයෑම් සහ ජල ගැලීම් අවම කළ හැකිද; ඒ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මකවීමෙන් දැරණියගල නගරයත් එහි පෞරාණික ස්ථාන, සංස්කෘතිකමය වටිනාකමක් සහිත ප්‍රදේශ, කෘෂිකාර්මික සහ අපනයන බෝග වගා විනාශ වීම තුළින් පාරම්පරික ජන ජීවිත අඩාල වීමක් සිදු නොවන්නේද?

(ii) මෙම ව්‍යාපෘතිය හේතුවෙන් පීඩාවට පත්වන ජනතාව නැවත පදිංචි කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

134/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට අද දක්වා ප්‍රසිද්ධ රූගුම් පාලක මණ්ඩලයේ සිටි සාමාජිකයන්ගේ නම් හා ඔවුන්ගේ සේවා කාලසීමා කවරේද;

(ii) එම එක් එක් කාලසීමාව තුළ ප්‍රදර්ශනයට අනුමත කළ සිංහල චිත්‍රපටවල නම් කවරේද;

(iii) එම එක් එක් කාලසීමාව තුළ වාරණයට ලක්වූ සිංහල චිත්‍රපට හා ඒවායේ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iv) එම චිත්‍රපට වාරණය කිරීමට ප්‍රසිද්ධ රූගුම් පාලක මණ්ඩලය ගත් තීරණවලට හේතු කවරේද;

(v) යහපාලන රජය යටතේ වාරණයෙන් තොරව ගුණාත්මක සිංහල චිත්‍රපට කලාවක් බිහිකිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

241/'18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට වාහන ඇතුල් කිරීමේදී හා එම මධ්‍යස්ථානය තුළ වැසිකිළි භාවිතා කිරීම වෙනුවෙන් ගාස්තු අයකිරීමේදී විවිධ අයථා ක්‍රියා හා මූල්‍ය අක්‍රමිකතා සිදුවන බවට ගොවි ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) එසේ නම්, දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ සිදුවන එවැනි අකටයුතුකම් පාලනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

379/'18

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මීතොටමුල්ලට අමතරව, පළාත් පාලන ආයතන මඟින් බැහැර කර මේ වනවිට නිර්මාණය වී ඇති කසළ කඳු කවරේද;

(ii) ඒවා අයත්වන පළාත් පාලන ආයතන කවරේද;

(iii) වර්තමානයේ මෙම කසළ කඳුවල ඇති කසළ ප්‍රමාණය කොපමණද;

(iv) මේවා අතර දැනට අවදානම් තත්ත්වයේ පවතින කසළ කඳු තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙවැනි කසළ කඳුවලට තවදුරටත් කසළ බැහැර කරමින් ඒවා වර්ධනය වීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, ඒ සඳහා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ කිසියම් වැඩපිළිවෙළක් ආරම්භ කර තිබේද;

(iii) මේ සඳහා දේශීය හා විදේශීය වශයෙන් ආයෝජන ලබා ගැනීමේ වැඩසටහනක් තිබේද;

(iv) එසේ නම්, ඒවා කවරේද;

(v) මේ වනවිට යම් වැඩසටහනක් ආරම්භ කර තිබේ නම්, එහි ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

590/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2016 අයවැය යෝජනා අංක 292ට අනුව, ඩොලර් බැඳුම්කරවලට අතිරේකව ඉදිරි පියවරක් ලෙස, චීන යුආන් සහ සුකුක් බැඳුම්කර නිකුත් කිරීමට දැරූ ප්‍රයත්නය සාර්ථක වූයේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා රජය විසින් මේ දක්වා නිකුත් කර ඇති ඩොලර් බැඳුම්කර නිකුත් කළ දිනය, ලබාගත් ඩොලර් ප්‍රමාණය, පොළී අනුපාතිකය සහ කල් පිරීමේ දිනය යනාදි දත්ත දැක්වෙන වගුවක් ඉදිරිපත් කරන්නේද;

(ii) අධික පොළියට ජාත්‍යන්තර වෙළඳපොළෙන් ණය ලබා ගැනීමක් ලෙස හඳුන්වනු ලැබූ, ඩොලර් බැඳුම්කර නිකුතුව මඟින්, ලංකා ඉතිහාසයේ වැඩිම ණය ප්‍රමාණය ලබාගත් වර්ෂය සහ පොළී ප්‍රමාණය කවරේද;

(iii) චීන යුආන් බැඳුම්කර සහ සුකුක් බැඳුම්කර පිළිබඳ මුදල් අමාත්‍යවරයාගේ ප්‍රවේශය කෙබඳු වේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

691/’19

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2013 සිට 2017 දක්වා පොලිස් දෙපාර්තමේන්තුවේ පාවිච්චිය සඳහා කඳුළු ගෑස් මිලදී ගැනීමට වැය කරන ලද මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

760/’19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනාධිපති කාර්ය මණ්ඩලයේ හිටපු ප්‍රධානී ආචාර්ය අයි. එච්. කේ. මහානාම සහ රාජ්‍ය දැව සංස්ථාවේ හිටපු සභාපති පී. දිසානායක යන මහත්වරුන් ඔවුන්ගේ රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන සේවයේ ආරම්භයේ සිට මේ දක්වා,

(i) දරා ඇති තනතුරු;

(ii) එකී තනතුරු දරන ලද කාලවකවානු;

(iii) එම තනතුරු දරමින් සේවය කර ඇති ආයතන;

(iv) එකී සේවා කාලවලදී ඔවුන්ට එරෙහිව විනය හෝ වෙනයම් චෝදනා ඉදිරිපත්ව තිබුණේ නම්, එම චෝදනා සහ ඒවාට එරෙහිව ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආචාර්ය අයි. එච්. කේ. මහානාම මහතාට ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානි තනතුරට පත්වීමටත්, පී. දිසානායක මහතාට රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති තනතුර ලබා ගැනීමටත් නිර්දේශ ලබා දී ඇත්තේ කවුරුන්ද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## **2019 මාර්තු 25 වැනි සඳුදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

27/’18

ගරු හේෂා විතානගේ මහතා,— කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වැන්දඹු කාන්තාවන්ට ආර්ථික වශයෙන් ස්ථාවරභාවයක් ළඟා කර දීමට රජය විසින් ක්‍රියාමාර්ග ගනිමින් සිටින්නේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම කාන්තාවන්ට තම ඉදිරි කටයුතු කරගෙනයාම පිණිස අවශ්‍ය සහාය ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

135/’18

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි අ.පො.ස. (උසස් පෙළ) තාක්ෂණික විෂය ධාරාවෙන් පංති පැවැත්වෙන පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) දැනට බදුල්ල දිස්ත්‍රික්කය තුළ සිටින තාක්ෂණික විෂය උගන්වන ගුරුවරයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් හා දැනට සේවයේ නිරතව සිටින පාසල් කවරේද;

(v) ඉදිරියේදී බදුල්ල දිස්ත්‍රික්කයේ සිසුන් අතර තාක්ෂණික විෂය ප්‍රචලිත කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

219/’18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ග්ලයිෆොසේට් තහනම් කිරීමට රජය තීරණය කළ දිනය කවරේද;

(ii) ඒ සඳහා බල පෑ හේතු කවරේද;

(iii) එම තහනම සඳහා නිර්දේශ ඉදිරිපත් කළ විද්වත් සංවිධාන හෝ පුද්ගලයන් කවුරුන්ද;

(iv) ග්ලයිෆොසේට් තහනම ඉවත් කිරීමට රජය තීරණය කළ දිනය කවරේද;

(v) ඒ සඳහා බල පෑ හේතු කවරේද;

(vi) තහනම ඉවත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කළ විද්වත් සංවිධාන හෝ පුද්ගලයන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

245/’18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එම කොට්ඨාසය තුළ කැණීම් නොකරන ලද එහෙත්, හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන පිහිටා තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) ඉහත කොට්ඨාසයේ පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත රජමහා විහාර සංඛ්‍යාව කොපමණද; ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත පුරාවිද්‍යාත්මක ස්ථානවල සංරක්ෂණ කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

336/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් "අක්කර 500" ගමේ සිට කලාවැව, කුසලානගම දක්වා වූ කිලෝමීටර් 3ක් පමණ වූ මාර්ගය දැඩි ලෙස අබලන් වී ඇති බව දන්නේද;

(ii) එය කඩිනමින් නවීකරණය කිරීම සඳහා පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

464/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුවට මුහුණ පා සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් පදිංචි ග්‍රාම නිලධාරි වසම්වල නම් කවරේද;

(iii) පානීය ජල ගැටලුවට විසඳුම් ලබාදීම සඳහා "පුත්තලමට නවෝදය" වැඩපිළිවෙළ යටතේ ගෙන ඇති පියවර කවරේද;

(iv) එම ව්‍යාපෘතිය යටතේ මේ වනවිට පුත්තලම දිස්ත්‍රික්කයේ පානීය ජල පහසුකම් ලබා දී ඇති පවුල් සංඛ්‍යාව ග්‍රාම නිලධාරි වසම් අනුව කවරේද;

(v) පුත්තලම දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුව විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

491/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ පශු සම්පත් කටයුතුවල යෙදී සිටින ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කයේ පශු සම්පත් සංවර්ධනය සඳහා දැනට ගෙන ඇති පියවර කවරේද;

(iii) පශු සම්පත් සංවර්ධන කටයුතුවල නියැලි නිලධාරින් රාජකාරි කටයුතු සිදු කිරීමේදී විවිධ බාධාවන්ට මුහුණ දෙන බව දන්නේද;

(iv) මහනුවර දිස්ත්‍රික්කයේ පශු සම්පත් සංවර්ධනය සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

537/’19

ගරු බිමල් රත්නායක මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (SLIATE) ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය මෙතෙක් පවත්වන ලද ස්ථානය කවරේද;

(ii) 2017 වර්ෂයේදී එම ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය පවත්වනු ලැබූ ස්ථානය කවරේද;

(iii) මේ සඳහා පසුගිය වර්ෂයේදී එක් ඩිප්ලෝමාධාරියෙකුගෙන් අය කරනු ලැබූ මුදල කොපමණද;

(iv) 2017 වර්ෂයේදී ඒ සඳහා එක් ඩිප්ලෝමාධාරියෙකුගෙන් අය කරන ලද මුදල කොපමණද;

(v) පෙර වර්ෂවල ශාලා පහසුකම් සඳහා ගෙවීම් කළ යුතු වූ බැවින්, මුදල් අය කරනු ලැබුවද 2017 වර්ෂයේදී නොමිලේ ශාලා පහසුකම් සපයනු ලබන විටත් මුදල් අයකිරීමට හේතුව කවරේද;

(vi) මේ දක්වා ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය පැවති කොළඹ නගරය වෙනුවට කොළඹින් බැහැර නවාතැන් පහසුකම් පවා සොයාගත නොහැකි අම්පාර වැනි දුෂ්කර ප්‍රදේශයකට එම උත්සවය රැගෙන යාමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 මාර්තු 26 වැනි අඟහරුවාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

85/’18

ගරු දයාසිරි ජයසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඉස්සන් වගා කරනු ලබන ප්‍රදේශ කවරේද;

(ii) අපනයනය කිරීම සඳහා ඉස්සන් වගා කරනු ලබන වගාකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ වාර්ෂික ඉස්සන් නිෂ්පාදනය කොපමණද;

(iv) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ ඉස්සන් වගාවෙන් ලද වාර්ෂික විදේශ විනිමය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉස්සන් වගා කිරීම සඳහා රජය ලබා දී ඇති සහන කවරේද;

(vi) ඉදිරියේ දී ඉස්සන් වගාවෙන් ලැබෙන විදේශ විනිමය වැඩි කර ගැනීම සඳහා රජය කටයුතු කරන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග පැහැදිලි කරන්නේද;

(viii) වගාකරුවන් ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන පියවර පැහැදිලි කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

242/'18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් බොහෝ පිරිසකගේ නිවාසවලට හානි සිදු වී ඇති බවත්;

(ii) එසේ නිවාස හානි වූ පිරිසෙන් 220 දෙනෙකුට සිය නිවාස අතහැර දමා යන ලෙස දැනුම් දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නිවාස අතහැර යන ලෙස දැනුම් දී ඇති නිවාස හිමියන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) නිවාස අතහැර යෑමට පෙර ඔවුන්ට ලබා දුන් පොරොන්දු මෙතෙක් ඉටු වී නොමැති බව දන්නේද;

(iii) පීඩාවට පත් 220ක් පමණ වූ නිවාස හිමියන්ගේ ගැටලුව විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

381/'18

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට වසර 106ක් සපුරන ශ්‍රී ලංකා බාලදක්ෂ ව්‍යාපාරයට 75000 කට අධික බාලදක්ෂ දරු දැරියන් අයත් වන බවත්;

(ii) බාලදක්ෂයන් "වැඩ සතියේ" දී වාර්ෂිකව උපයා බාලදක්ෂ මූලස්ථානයට ලබා දෙන රුපියල් මිලියන 8ක මුදල පසුගිය පස් වසරක කාලයේදී නිසි ක්‍රමවේදයකින් තොරව වියදම් කර ඇති බවත්;

(iii) මූලස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීමේදී බාලදක්ෂ කමිටු සාමාජිකත්වයේ අවසරයකින් තොරව, හිටපු ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස් නිමල් ද සිල්වා මහතාගේ හිතවත් සමාගමකට උපදේශක ගාස්තු ලෙස රුපියල් මිලියන 8ක්ද, නිසි පරිදි ඉදිකිරීම් නොකළ ගොඩනැගිල්ල වෙනුවෙන් රුපියල් මිලියන 14ක්ද ගෙවා ඇති බවත්;

(iv) බාලදක්ෂ "වැඩ සතියේ" උපයන ලද මුදල් භාවිතා කරමින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිසි අවසරකින් තොරව නුවරඑළිය ප්‍රදේශයේ බාලදක්ෂ කඳවුරක් සඳහා ඉදිකරන ලද සිමෙන්ති කුටි තහනම් කිරීම හේතුවෙන් විශාල මූල්‍ය පාඩුවක් සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මෙම මුදල් අවභාවිතාව සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් ආරම්භ කර තිබේද;

(ii) එහි ප්‍රගතිය කවරේද;

(iii) නොඑසේ නම්, ඉදිරි කාලයේදී මෙම කාරණය සම්බන්ධයෙන් පූර්ණ විමර්ශනයක් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

565/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ගොවිසෙත' ලොතරැයිය ආරම්භ කළ දිනය කවරේද;

(ii) එහි ආරම්භක අරමුණු කවරේද;

(iii) එම ලොතරැයිය ආරම්භයේ සිට මේදක්වා එය අලෙවි කිරීම මඟින් ඉපයූ ආදායම වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ආදායමෙන් ත්‍යාග වශයෙන් ලබාදුන් මුදල වාර්ෂිකව කොපමණද;

(v) ගොවි ජනතාවගේ සුබසාධනය සඳහා වැයකළ මුදල කොපමණද;

(vi) ඉදිරියේදී වැඩි මුදලක් ගොවි ජනතාවගේ සුබසාධනය සඳහා වැය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

591/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 290 ට අනුව, ලැයිස්තුගත දේපළ වෙළඳාම් භාරයක් (Real Estate Trusts) පිහිටුවනු ලැබුවේද;

(ii) එවැනි භාරයක් පිහිටුවීමට අදාළ ප්‍රාරම්භක කාර්යයන් පිළිබඳ වගකීම පවරා දුන් පාර්ශ්ව කවරේද;

(iii) ලැයිස්තුගත ඒකක භාරයක් පිහිටුවීමකින් තොරව, රජයේ ඉඩම් මහා පරිමාණ නිවාස ව්‍යාපෘති සඳහා පෞද්ගලික ව්‍යාපාරිකයන්ට පවරා දී තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වන කොන්දේසි හා ගෙවීම් කවරේද;

(v) රජයේ ඉඩම්, මහා පරිමාණ නිවාස සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් පෞද්ගලික ව්‍යාපාරිකයන්ට පවරාදීමේදී ඒ සඳහා නිසි පරිදි අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී තිබේද;

(vi) එසේ නම්, පෞද්ගලික ව්‍යවසායකයන් තෝරාගැනීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

679/'18

ගරු කනක හේරත් මහතා,— කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පැරණි වතු නිවාස (ලැයින් කාමර) වෙනුවට නව නිවාස ලබාදීමේ වැඩපිළිවෙළ යටතේ නිවාස ලබා දී ඇති වතු පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙතෙක් නිවාස ලබා දී නොමැති වතු පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිවාස ලබාදීමේ වැඩසටහනට අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ නිවාස ලබා දිය යුතු වතු පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙතෙක් නිවාස ලබා දී ඇති වතු පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) නිවාස ලබා නොදුන් වතු පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එක් වතු නිවසක (ලැයින් කාමරයක) මේ වනවිට පවුල් කිහිපයක් එකට පදිංචි වී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, නව නිවාස ලබාදීමේ වැඩපිළිවෙළ කඩිනම් කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

692/'19

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.09 දින සිට 2017.11.30 දින දක්වා ඇමරිකන් එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව, ශ්‍රී ලංකා රුපියල පිරිහී ඇති අගය කොපමණද;

(ii) එකී කාල වකවානුව තුළ රුපියලේ පිරිහීම හේතුවෙන් ආණ්ඩුවේ විදේශ ණය ඉහළ ගොස් ඇති ප්‍රමාණය රුපියල් වලින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

761/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආචාර්ය අයි. එච්. කේ. මහානාම මහතා, ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් තනතුර දැරීමට පෙර අග්‍රාමාත්‍ය අතිරේක ලේකම් තනතුර ද දරා ඇති බවත්;

(ii) එම කාලයේදී ප්‍රධාන ගණන්දීමේ නිලධාරි ලෙස අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලවල තීරණ ගැනීම පමණක් නොව, අමාත්‍ය මණ්ඩලය පත්කළ ටෙන්ඩර් මණ්ඩලවල ද කටයුතු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඖෂධ ආනයනය වැනි කටයුතු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය පත්කළ ටෙන්ඩර් මණ්ඩලවල සභාපති/සාමාජික ලෙස ආචාර්ය මහානාම මහතා කටයුතුකර ඇති දින වකවානු හා දරා ඇති තනතුරු කවරේද;

(ii) එම ටෙන්ඩර් මණ්ඩලවලට ටෙන්ඩර් ඉදිරිපත් කර ඇති ආයතන සහ ඒවායේ සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) ඉදිරිපත්ව තිබූ ටෙන්ඩර්වලින් අනුමතිය ලද ටෙන්ඩර්වලට අදාළ ආයතන හා මිල ගණන් කවරේද;

(iv) ආචාර්ය මහානාම මහතාගේ සභාපතිත්වයෙන් හෝ සහභාගිත්වය සහිත ටෙන්ඩර් මණ්ඩලවල අනුමතිය මත මෙරටට ආනයනය කර ඇති ඖෂධ වර්ග, ප්‍රමාණයන් හා රටවල් කවරේද;

(v) 2010 වර්ෂයේ සිට මේ දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩල ටෙන්ඩර් මණ්ඩල රැස්වූ දිනයන් සහ එහි සාමාජිකයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 මාර්තු 27 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

29/'18

ගරු හේෂා විතානගේ මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ලැබූ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එහි අද වනවිට පවතින ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iii) අධිකාරිය විසින් ලබා ගෙන ඇති කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය ආදියෙහි මුළු එකතුව කොපමණද;

(iv) අධිකාරිය විසින් පසුගිය රජය යටතේ සහ වර්තමාන රජය යටතේ සිදුකරන ලද ව්‍යාපෘතිවල ප්‍රතිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට යෝජිත නව ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

136/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නියුක්තව සිටින මුළු නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරින්ගේ නම්, තනතුරු නාම සහ සේවා ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) දැනට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා පුරප්පාඩු පවතින සේවා ස්ථාන කවරේද;

(iv) එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය විසින් තරහ විභාග පවත්වා තිබේද;

(v) එසේ නම්, එම විභාගයෙන් සමත් වූ අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(vi) එම පිරිසට පත්වීම් ලබාදීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

220/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇස්බැස්ටෝස් භාවිතය තහනම් කිරීමට රජය තීරණය කළ දිනය කවරේද;

(ii) ඒ සඳහා බල පෑ හේතු කවරේද;

(iii) එම තහනම සඳහා රජය විසින් පදනම් කරගත් විද්වත් කමිටු හෝ විශේෂඥ වාර්තා කවරේද;

(iv) එම තහනම ඉවත් කිරීම සඳහා රජය තීන්දු කළ දිනය කවරේද;

(v) ඒ සඳහා බල පෑ හේතු කවරේද;

(vi) යළිත් ඇස්බැස්ටෝස් භාවිතය සුදුසු බව නිර්දේශ කළ විද්වතුන් හෝ විශේෂඥයන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

246/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එම කොට්ඨාසය තුළ කැණීම් නොකරන ලද එහෙත්, හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන පිහිටා තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) ඉහත කොට්ඨාසයේ පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත රජමහා විහාර සංඛ්‍යාව කොපමණද; ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත පුරාවිද්‍යාත්මක ස්ථානවල සංරක්ෂණ කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

337/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වූ ඇඟලුම් කර්මාන්තශාලාවලින් සියයට පනහක් පමණ මේ වනවිට වැසී ගොස් ඇති බව දන්නේද;

(ii) රජයේ අනුග්‍රහයෙන් හෝ එම ඇඟලුම් කර්මාන්තශාලා නැවත යථා තත්ත්වයට පත්කර ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳීමට අවශ්‍ය පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

465/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වනාතවිල්ලුව, පුබුදුගම ධීවර ගම්මානයේ සිට රෙඩ්බානා ධීවර ගම්මානය දක්වා "ඉපැරණි අම්බලම් ග්‍රාමීය මාර්ගය" නමින් මාර්ගයක් තිබෙන බවත්;

(ii) එම මාර්ගය මේ වනවිට දැඩි ලෙස අබලන්වී තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ධීවර ගම්මානයේ ජීවත්වන ජනතාවගේ පහසුව සඳහා එම මාර්ගය සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

492/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, බෝගහකන්ද, සීවලීකන්ද සහ බුලත්ගොල්ල යන ගම්මානවලට නල ජලය නොමැති වීම හේතුවෙන් එම ගම්මානවල ජනතාව විශාල පීඩාවකට ලක්වී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම ගම්මානවල ජනතාවට නල ජලය ලබා දීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

538/'19

ගරු බිමල් රත්නායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර, ධර්මරාජ විද්‍යාලයට ළමුන් ඇතුලත් කර ගැනීමේදී පදිංචිය තහවුරු කිරීම සඳහා සින්නක්කර ඔප්පු, තෑගි ඔප්පු සහ බදු ඔප්පු ඉදිරිපත් කරන පුද්ගලයන්ට වැඩි ලකුණු ප්‍රමාණයක් ලැබෙන බවත්;

(ii) ඉහත සඳහන් ඔප්පු නොමැති නගර සභා නිවාසවල ජීවත්වන පවුල්වල අයට තම පදිංචිය තහවුරු කිරීමට ඇත්තේ නගර සභාවෙන් නිකුත් කරනු ලබන බදු ලියවිල්ල පමණක් බවත්;

(iii) එම ලියවිල්ල සඳහා ඉතා අඩු ලකුණු ප්‍රමාණයක් ලබාදීම හේතුවෙන් ඔවුන්ගේ ළමුන්ට ධර්මරාජ විද්‍යාලයට ඇතුලත් වීමට ඉඩක් නොලැබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රජයට වරිපනම් බදු ගෙවමින් පරම්පරා ගණනාවක සිට මෙම නිවාසවල ජීවත්වන පවුල්වල ළමුන් ද ධර්මරාජ විද්‍යාලයට ඇතුලත් කළ හැකි ක්‍රමවේදයක් සකස් කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 මාර්තු 28 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

243/'18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උකුවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් අල්කඩුව නම් නගරයක් තිබෙන බවත්;

(ii) එම නගරය තුළ පොදු වැසිකිළි හා ජල කරාම පද්ධතියක් වැනි පොදු පහසුකම් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, උකුවෙල නගරය දියුණු කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

363/'18

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු බෝහිල් වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල්, සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, ලියාපදිංචි සාමාජික අංකය, සේ.නි.භා.අරමුදල්, සේ.අර්ථසාධක අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

390/'18

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික දැව භාවිතය කොපමණද;

(ii) එසේ නම්, එම දැව අවශ්‍යතාවය සපුරා ගනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට දැව ආනයනය කරන බව දන්නේද;

(ii) එසේ නම්, වර්ෂ 2014 සිට 2016 දක්වා කාලය තුළ ආනයනය කර ඇති ඉරූ දැව ප්‍රමාණය සහ ඒවායේ වටිනාකම එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iii) ඉහත සඳහන් වර්ෂ තුන ඇතුළතදී ගෘහභාණ්ඩ වශයෙන් මෙරටට ආනයනය කරන ලද දැව භාණ්ඩවල වටිනාකම කොපමණද;

(iv) එම වර්ෂ තුන තුළදී ආනයනය කරන ලද දැව සඳහා වැය වී ඇති මුළු මුදල කොපමණද;

(v) පසුගිය කාලයේදී දැව ආනයනය සීඝ්‍ර වශයෙන් ඉහළ යාමට හේතු කවරේද;

(vi) මෙරටට දැව ආනයනය කිරීමේදී වැය වන විශාල විදේශ විනිමය ප්‍රමාණය අවම කර ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

551/'19

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010 වර්ෂයේදී, "ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණයක්" යන තේමාව යටතේ, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ නගර මධ්‍යයේ පිහිටි පොදු ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර අවුරුදු 09ක් ගතවී ඇතත්, මේ දක්වා එම ක්‍රීඩාංගණය කිළිනොච්චි දිස්ත්‍රික්කයේ ක්‍රීඩකයන්ගේ භාවිතය සඳහා ලබාදී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ක්‍රීඩාංගණය ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණයක්ද; නොඑසේ නම්, දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩාංගණයක්ද;

(ii) මෙම පොදු ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු සඳහා වෙන්කරන ලද මුදල කොපමණද;

(iii) පසුගිය වර්ෂ 09ක කාලය තුළදී මෙම මුදලින් වියදම් කරන ලද ප්‍රමාණය කොපමණද;

(iv) මෙම ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු සඳහා මේ දක්වා ගිවිසුමට එළඹී ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ සංඛ්‍යාව කවරේද;

(v) මේ වනවිට කොන්ත්‍රාත් කටයුතුවල නිරත වන කොන්ත්‍රාත්කරුවන්ගේ මෙහෙයුම් කටයුතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් දිස්ත්‍රික්කයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් කොතරම් දුරට අපහසුවට පත්වී සිටින්නේද;

(ii) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස අමාත්‍යාංශයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

566/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා ගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව විසින් බණ්ඩාරගම නගරයේ ආයුර්වේද බෙහෙත් ශාලාව පවත්වාගෙන යන ලද ස්ථානයේ බදුදීම සඳහා කඩ කාමර ඉදිකරනු ලැබුවේද;

(ii) එසේ නම්, ඉදිකරන ලද කඩ කාමර සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වැය වූ මුදල සහ මුදල් සපයන ලද්දේ කවුරුන් විසින්ද;

(iv) එම කඩ කාමර බදුදීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(v) එක් එක් කඩ කාමරය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ තැනැත්තන්ගේ නම, ලිපිනය, කඩ කාමර අංකය සහ ඉදිරිපත් කරන ලද මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එකී ටෙන්ඩරය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා,

(i) ගන්නා ලද ක්‍රියාමාර්ග;

(ii) දැන්වීම පළ කරන ලද එක් එක් පුවත්පත, දැන්වීමේ දිනය සහ දැන්වීම් ප්‍රමාණය;

(iii) බැනර් හෝ දැන්වීම් පුවරු මඟින් ප්‍රදර්ශනය කරන ලද්දේ නම්, එම ස්ථාන;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) උක්ත දැන්වීම්වල පිටපත් ඉදිරිපත් කරන්නේද?

(ii) ඉහත ටෙන්ඩර් කැඳවීම සඳහා ප්‍රමාණවත් ටෙන්ඩර්කරුවන් නොසිටි බව පිළිගන්නේද;

(iii) මෙම ගැටලුව විසඳා ගැනීම සඳහා එම කඩ කාමර සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමට නිර්දේශ කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

592/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 289ට අනුව, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග කවරේද;

(ii) 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් මේ දක්වා ලඟාකර ගත් ප්‍රගතිය කවරේද; ඒ පිළිබඳ වගකීම පවරා ඇති පුද්ගලයන් කවුරුන්ද;

(iii) ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය ශක්තිමත් කිරීමට 2016 අයවැයෙන් වෙන්කර දුන් රුපියල් මිලියන 100 උපයෝජනය කරගත් ආකාරය පැහැදිලි කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

693/'19

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017.07.31 දිනට රැකියා දස ලක්ෂයේ රජයේ ව්‍යාපෘතිය යටතේ ලබා දී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

762/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වනවිට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන නිවාස ආධාර, නිවාස ණය හා උපකරණ ලබා දීම සහ නිවාස ඉදිකර දීම ආදි වැඩසටහන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) "ග්‍රාම ශක්ති" නමැති රුපියල් ලක්ෂ 5ක නිවාස ආධාර වැඩසටහන, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(ii) එම වැඩසටහන යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) ඒ සඳහා ප්‍රතිලාභීන් තෝරාගන්නා ක්‍රමවේදය සහ ඒ සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා කවරේද;

(iv) එම වැඩසටහන යටතේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව තෝරාගෙන ඇති පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) ඒ සඳහා යම් යම් දේශපාලන පක්ෂවල සංවිධායකවරයන්ගේ ලිපි අනුව ප්‍රතිලාභීන් තෝරා ගන්නා බවට පැමිණිලි ලැබෙන බැවින් ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 මාර්තු 29 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

31/'18

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1978 වර්ෂයෙන් ඇරඹී පළමුවන පාර්ලිමේන්තුවේ සිට අටවැනි පාර්ලිමේන්තුව දක්වා එක් එක් පාර්ලිමේන්තුවට අදාළව ඇති කරන ලද අමාත්‍ය මණ්ඩලවල සිටි කැබිනට්, රාජ්‍ය සහ නියෝජ්‍ය අමාත්‍යවරයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් අමාත්‍ය මණ්ඩලයේ සිටි අමාත්‍යවරියන් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් අමාත්‍ය මණ්ඩලයේ සිටි අමාත්‍යවරියන් සංඛ්‍යාව අදාළ අමාත්‍ය මණ්ඩලයේ සිටි මුළු අමාත්‍යධුර සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) රටේ වර්තමාන කාන්තා ජනගහනයේ ප්‍රතිශතයට සරිලන සාධාරණ නියෝජනයක් අමාත්‍ය මණ්ඩල තුළ කාන්තාවන්ට ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

138/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, වැවිලි සමාගම් ආශ්‍රිතව සේවය කරන සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල මන්ද පෝෂණය ඉහළ මට්ටමක පවතින බව දන්නේද;

(ii) යහපාලන රජය විසින් ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම සඳහා ලබාදෙන "පෝෂණ මල්ල" වැඩසටහනට සමගාමීව, වතු වැවිලි සමාගම් හරහාද එම ජනතාවට පෝෂණ මල්ලක් ලබාදීම සුදුසු බව පිළිගන්නේද;

(iii) එසේ නම්, වතු වැවිලි සමාගම් හරහා එවැනි වැඩසටහනක් දියත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

207/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පානදුර, වෑකඩ, ජන උදානගම නිවාසලාභීන් 35 දෙනෙක් 1993 වසරේ සිට එම ස්ථානයේ පදිංචිවී සිටින බවත්;

(ii) 2006 වසරේදී එවකට පානදුර නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා විසින් එම නිවාසලාභීන්ට නිත්‍යානුකූල ඔප්පු ලබාදිය යුතු බවට පානදුර නගර සභාවට ඉදිරිපත් කළ යෝජනාව ඒකමතිකව සම්මත වූ බවත්;

(iii) 2014 වසරේදී පානදුර නගර සභාව විසින් මැණුම් නියෝගයක් ලබාගෙන එම ඉඩම් මැන ඔප්පු ප්‍රදානය කිරීමට සූදානම් කර තිබූ බවත්;

(iv) 2018 වසරේ මැයි මාසයේදී වර්තමාන පානදුර නගර සභාව යළිත් එම යෝජනාව ඒකමතිකව සම්මත කරගත් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වෑකඩ, ජන උදානගම නිවාසලාභීන්ට මෙතෙක් නිත්‍යානුකූල ඔප්පු ලැබී නොමැති බව පිළිගන්නේද;

(ii) එම නිවාසලාභීන්ට ඔප්පු ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

338/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රළපණාව නොමැති වීමෙන් නාච්චාදූව වැවේ, වැව් ඉවුර ජල පහරට සේදී යාමේ අවදානමක් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, වැව් ඉවුරේ ආරක්ෂාව සඳහා රළපණාව සකස් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

493/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ ඇති බස් නැවතුම්පොළ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) යහපාලන රජය බලයට පත්වූ දින සිට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යොදවා සංවර්ධනය කරනු ලැබූ බස් නැවැතුම්පොළ සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) සෙසු බස් නැවතුම්පොළ සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

516/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) 2014.12.31 දිනට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවයේ නියුක්ත ස්ථිර, අනියම්, විශේෂ ව්‍යාපෘති හා පුහුණුවන කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2017.09.30 දිනට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවයේ නියුක්ත ස්ථිර, අනියම්, විශේෂ ව්‍යාපෘති හා පුහුණුවන කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2017.09.30 දිනට ඉහත එක් එක් කාර්ය මණ්ඩලයේ සේවයේ නියුක්ත පුද්ගලයන්ගේ නම, ලිපිනය, පදිංචි ග්‍රාම නිලධාරි වසම සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහන් ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

539/'19

ගරු බිමල් රත්නායක මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහජන බැංකුවේ සේවා දිගු ලබාදීමේ ප්‍රතිපත්තිය අනුව වයස අවුරුදු 60 දක්වා සේවා දිගු ලබා දෙන බවත්;

(ii) කළමනාකාරිත්වය මෙම සේවා දිගු ලබාදීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී බැංකුවේ දූෂණ හෙළිදරව් කළ වෘත්තීය සමිති නායකයන් මර්දනය කිරීම සඳහා යොදා ගන්නා බවත්;

(iii) ඒ අනුව, මහජන බැංකුව ඩිජිටල්කරණය පිළිබඳව විනිවිදභාවයෙන් යුතු පරීක්ෂණයක් ඉල්ලා සිටි ලංකා බැංකු සේවක සංගමයේ, මහජන බැංකු ශාඛාවේ, හිටපු සභාපති එස්. කේ. ඩී. හේවාපතිරණ මහතාට ලබාදී තිබූ වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කිරීම මුලින්ම අවලංගු කරන ලද බවත්;

(iv) ඉන්පසුව ඔහු ඉල්ලා සිටි සේවා දිගුව ලබා නොදී ඔහු විශ්‍රාම ගැන්වීමට කළමනාකාරිත්වය කටයුතු කර ඇති බවත්;

(v) ඔහු ඉල්ලා සිටි පරීක්ෂණය ද සිදු නොකළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හේවාපතිරණ මහතා ඉල්ලා සිටි සේවා දිගුව ලබා දෙන්නේද;

(ii) එසේ නම් එම දිනය කවරේද;

(iii) හේවාපතිරණ මහතා ඉල්ලා සිටි පරීක්ෂණය සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

680/'18

ගරු කනක හේරත් මහතා,— ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වෙසෙන වැඩිහිටි (අවු. 60 ඉක්ම වූ) ජනතාව සඳහා රජය විසින් සලසන සුබසාධන පහසුකම් කවරේද;

(ii) 2001 සහ 2011 වර්ෂවලදී ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහන ප්‍රතිශතය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iii) පුරෝකථනයන්ට අනුව 2021 වර්ෂය වනවිට එම ප්‍රතිශතය කොපමණ විය හැකිද;

(iv) ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහන ප්‍රතිශතය වාර්ෂිකව සීඝ්‍රයෙන් ඉහළ යන බව දන්නේද;

(v) එසේ නම්, ඉහළ යන මෙම වැඩිහිටි ජනගහනයේ සුරක්ෂිතතාවය සහ සුබසාධනය සඳහා යම් වැඩපිළිවෙළක් දියත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වැඩිහිටියන් සඳහා ලබාදෙනු ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසි හැඳුනුම්පතෙන් රජය බලාපොරොත්තු වන සහන ඉටු වන්නේද;

(ii) ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා අය කරනු ලබන බද්දෙන් ඔවුන් නිදහස් කිරීම සඳහා ඔබ අමාත්‍යාංශය මැදිහත් වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ තිබෙන වැඩිහිටි නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැඩිහිටි නිවාසවල ප්‍රමිතිය සලකා බැලීම සඳහා යොදා ගනු ලබන නිර්ණායක කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?